# - සද්ධර්මාලංකාරය -

අනුරාධපුරය, පොලොන්නරුව, දඹදෙණිය, කුරුණෑගල ආදි පූර්ව යුගයන් හා සසඳන විට ප්‍රාමාණික වශයෙන් බොහෝ ග්‍රන්ථ ප්‍රමාණයක් ගම්පොළ රාජධානි සමයේ බිහි විණැයි කිව නො හැකි වුව ද සාපේක්ෂ වශයෙන් සාහිත්‍ය යුගයක් ලෙස කතා කළ හැකි තරමේ වර්ධනීය ස්වරූපයක් දකිය හැකි ය. ගම්පොළ යුගයේ දී සිදු වූ සාහිත්‍ය ප්‍රගමනයට ඊට පූර්ව යුගවල දී සිදු වූ සාහිත්‍යාංගවල ආභාසය ද නො අඩුව ම බලපාන්නට ඇත. වෙනත් යුගයන්ට සාපේක්ෂ ව තරමක් ගම්පොළ යුගය තුළ සිංහල, පාළි, සංස්කෘත යන ප්‍රධාන ප්‍රාචීන භාෂාවන්හි විශාල දියුණුවක් ලබා තිබූ යුගයක් බව කිව හැකි ය.

එසේ ම වෙනත් යුගයන්ට සාපේක්ෂ ව තරමක් ගම්පොළ යුගය තුළ සිංහල, පාළි, සංස්කෘත යන ප්‍රධාන ප්‍රාචීන භාෂාවන්හි විශාල දියුණුවක් ලබා තිබූ යුගයක් බව කිව හැකි ය. ගම්පොළ යුගයේ පාළි භාෂාවේ තිබූ දියුණුව එම යුගයේ මතු සඳහන් කෘතීන් කෙරෙන් ද මනා ව ස්ඵුට වේ.

- ජනානුරාග චරිත
- පාරමී මහා සතකය
- සූවිසි විවරණය (චතුබ්බීසති බ්‍යාකරණං)
- ජිනබොධාවලි
- විමුක්ති සංග්‍රහය
- සුජනප්පසාද ගාථා
- වුත්තමාලා සතකය
- වීරබාහාදිපාද ථුතිගීතිකා

**සද්ධර්මාලංකාරය** හා **නිකාය සංග්‍රහය** යන සිංහල පොත් දෙකත් **ජිනබෝධාවලී** නම් පාළි පද්‍ය ග්‍රන්ථයත් **බාලාවතාර** නම් පාළි ව්‍යාකරණයට සිංහල සන්නයත් ලිවීමෙන් විශාල සාහිත්‍ය සේවයක් කළ පඬිවරයෙකි, ජයබාහු ධර්මකීර්ති මාහිමියෝ. මේ ජයබාහු ධර්මකීර්ති මාහිමියන් පමණක් නො ව සමස්ත ධර්මකීර්ති පරපුර ම සිංහල හා පාළි ග්‍රන්ථ රචනා කිරීමෙන් හෙළ සාහිත්‍යයට ඉමහත් සේවයක් කළ පඬිවරයින් ලෙස හෙළ සාහිත්‍ය ඉතිහාසයෙහි ඉහළින් ම සඳහන් වෙයි.

ශීලවංශ ධර්මකීර්ති ස්වාමීන් වහන්සේගේ ගෝල ශිෂ්‍ය නමක වූ මෙතුමාණෝ සිය ආචාර්යවරයාගේ පිය සටහන් අනුව ම යමින් ශාසනයෙහි ද භාෂා ශාස්ත්‍රයෙහි ද උන්නතිය උදෙසා ඇප කැප වී ක්‍රියා කළහ. මුන් වහන්සේ සංඝරාජ ධුරයෙන් ද පිදුම් ලැබූ බව සද්ධර්මරත්නාකරයේ එන තොරතුරුවලින් තහවුරු වේ.

දේවරක්ෂිත ජයබාහු ධර්මකීර්ති ස්වාමීන් වහන්සේ ද්විතීය ධර්මකීර්ති ස්වාමීන්ද්‍රයන් වහන්සේ ලෙස උන් වහන්සේගේ අනුජාත ශිෂ්‍යයා වන ධම්මදින්නාචරිය විමලකීර්ති ස්වාමීන් වහන්සේ විසින් ම සද්ධර්මරත්නාකරයේ දී දක්වා ඇත. එසේ ම මුන් වහන්සේ ද්විතීය ධර්මකීර්ති ස්වාමීන්ද්‍රයන් ලෙස බහුප්‍රචාරයට ලක් ව ඇත.

මුන් වහන්සේගේ නාමකරණය පිළිබඳ ව ගවේෂණශීලී ප්‍රවේශයකට අපි ඉඩ ලබා ගනිමු.

නිකාය සංග්‍රහයේ කර්තෘ වශයෙන් සඳහන් වන්නේ 'දේවරක්ඛිත ජයබාහු මහාස්ථවිරපාදයන්' බව ග්‍රන්ථාරම්භයේ දී ඇති '**දේවරක්ෂිත ස්ථවිරාභිධාන පූර්වනාම ප්‍රකාශිත ජයබාහු මහා ස්ථවිර** පාදයෝ...' යන පාඨයෙන් හා ග්‍රන්ථාවසානයේ '**දේවරක්ෂිතාභිධාන ජයබාහු මහාස්ථවිරයන් විසින් උපදවන ලද මේ නිකාය සංග්‍රහ නම් වූ ශාසනාවතාර චරිතය...**' යන කොටසින් ප්‍රකාශ වේ. මේ දේවරක්ෂිත ජයබාහු මහාස්ථවිරයන්ගේ ප්‍රධානත්වයෙන් වීරබාහු රජුගේ උපකාර ඇති ව ක්‍රි. ව. 1396 දී සිදු කරන ලද ශාසන ශෝධන කටයුතුවල දී දේවරක්ෂිත ජයබාහු හිමියන් හඳුන්වන්නේ 'තත්කාල ශාසනානුශාසක ද්විතීය ධර්මකීර්ති මහාස්වාමිපාදයන්...' යනුවෙනි. උන්වහන්සේගේ ආචාර්යවරයා වූ ශීලවංශ ධම්මකිත්ති මාහිමියන් විසින් තම ශිෂ්‍යයාට ප්‍රව්‍රජ්‍යාව ලබා දෙන අවස්ථාවේ දී තැබූ නාමය වූයේ 'දේවරක්ෂිත' යන්න යි. මේ දේවරක්ෂිත සාමණේරයෝ ධර්මවිනය ඉගෙන විසිවයස් සම්පූර්ණ වී අධිශීල සංඛ්‍යාත උපසම්පදාවට පත්වීමෙන් පසු 'ජයබාහු' යන ගෞරව නාමයෙන් ද හැඳින්වූ හ.

ඒ අනුව උන් වහන්සේ 'දේවරක්ෂිත ජයබාහු' නම් වූ අතර තවත් වසර 10ක් ගත වූ පසු 'ස්ථවිර' පදවියෙන් ද තවත් වසර 10ක් ගත වූ පසු ව 'මහාස්ථවිර' යනුවෙනි. පසු ව මාහිමි හෙවත් සංඝරාජ තත්වයට පත් වූ උන්වහන්සේට 'ධර්මකිත්ති' යන ගෞරව නාමයක් ද ලැබුණි. එය සද්ධර්මරත්නාකරයේ 'දේවරක්ෂිත ස්ථවිරාභිධාන ජයබාහු මහා ස්ථවිර නම් වූ පූර්වනාමයෙක් ඇති දෙවන ධර්මකීර්ති මහාස්වාමිපාදයාණන්....' යන හැඳින්වීමෙන් ද ප්‍රකාශ වේ. මේ 'ධර්මකීර්ති' යන ආචාර්ය පරම්පරාවට අයත් ගෞරව නාමයත් මහාසාමි හෙවත් සංඝරාජපදවියත් දේවරක්ෂිත ජයබාහු හිමියන්ට ලැබී ඇත්තේ ක්‍රි. ව. 1396 දී මෙහෙණවර වංශික වීරබාහු රජතුමාගේ උපකාර ඇති ව පැවැත් වූ උපසම්පදා පුණ්‍යෝත්සවයේ දී ය.

දඹදෙණි යුගයේ විසූ ධර්මසේන මාහිමියන්ට අනතුරු ව පොදුජන ජීවිතයට වඩාත් හෘදයග්‍රාහී වූ, සුපේෂල හිමිනමක ලෙස  දේවරක්ෂිත ජයබාහු ද්විතීය ධර්මකීර්ති මාහිමියන් ව හඳුන්වා දිය හැකි ය.

උන්වහන්සේ තුළ වූ අපරිමිත මානව දායාර්ද්‍ර ගුණයේ ගුණසුවඳ සද්ධර්මයට අලංකාරයක් වී සද්ධර්මාලංකාරය නමින් හෙළ සාහිත්‍ය වාතලයට මුසු විය.

නූතනයේ ඉංග්‍රීසි භාෂාව ඇතැම් මානව කොට්ඨාස අතර යම් සේ අධිනිශ්චය වී පවතිත් ද එසේ ම ගම්පොළ යුගයේ දී පාළිය හෙවත් මාගධී භාෂාව ද සාමාන්‍ය ගැමි ජනතාව අතර අධිනිශ්චය වී පැවැතියේ ය.

බුද්ධභාෂිතය වූයේ පෙළ බස යි. එකී බුද්ධභාෂිතය බොහෝ සෙයින් රචනා වූයේ ද එකී පෙළ බසින් ම ය. පාළිය බොහෝ විට උගත්තේ භික්ෂූන් වහන්සේලා ඇතුළු වියත් පඬි පරපුරක් පමණි. එහෙයින් ම සාමාන්‍ය ජන විඥානයට පාළි භාෂාව ඥානනීය ව බොහෝ කෙනෙහිලිකම් කරන ලද්දේ විය.

කුඹුර, හේන, කමත සිය ජීවිතය කර ගත් සාමාන්‍ය ජනයාට පාළිය උගන්නට වේලාවක් කොයින් ද? යාමිතමින් ජීවිතය ගැටගසා ගන්නට තතනන ගැමියාට ත්‍රිපිටකය, විශුද්ධි මාර්ගය ආදි බෞද්ධ සාහිත්‍යාංග අතපත ගාන්නට වේලාවක් කොයින් ද?

ඒ කෙසේ වුව ද ඔවුන් තුළ පැවැතියා වූ අපරිමිත ශ්‍රද්ධා ගුණයෙහි වත් බුද්ධාලම්බන ප්‍රීතියෙහි වත් අල්පමාත්‍රයකුදු අඩු වීමක් දක්නට නො මැත්තේ විය. ඔවුහු පන්සල හා එකී ආරාමික සංස්කෘතියෙහි සාමාජීය පුරුක් වූ හ. නිරතුරු ව ම බණ දහමින්, ගුණ දහමින් සිය ජීවිතය හැඩගස්වා ගන්නට භික්ෂූන් වහන්සේලාත් පන්සලත් එක ළඟින් ඇසුරු කළ සැදැහැවත් බෞද්ධ උවසු උවැසියෝ වූ හ.

එහෙයින් බණට දහමට ඇලුම් කළ ගැමියාට තේරෙන සිංහලෙන් බණ කීම උදෙසා දේවරක්ෂිත ජයබාහු ධර්මකීර්ති මාහිමියන් අතින් සද්ධර්මාලංකාරය රචනා විය.

සද්ධර්මාලංකාරය රචනා වූයේ හුදෙක් ම පණ්ඩිත ප්‍රිය රීතියක් වහල් කරගනිමින් නො වේ. කතුවරයා ඉලක්ක කරගත්තේ සාමාන්‍ය ගැමි ජනයා ය. ඔවුහු සාධුජනයෝ වූ හ. එකී සාධු චර්යාවට ලෝකෝත්තර ශාන්තියක් අත්පත් කරදෙනු වස් සද්ධර්මාලංකාරය රචනා කළ බව කතු හිමියෝ ම මෙසේ දක්වති:

*'එතකුදු වුවත් ලෝවැඩ පිණිස බුදුන් විසින් වදාරන ලද්දා වූ සද්ධර්මය මාගධික භාෂාවෙහි නො හසළ සිංහලද්වීපවාසීන්ට නො දැනෙන හෙයින් හෙළුබසින් පෙරළා ලංකාද්වීපවාසී වූ සාධුජනයන්ගේ සිත් පහදවමින් ලෝවැඩ වඩා බොහෝ කාලයක් පවත්නා පරිද්දෙන් ධර්මව්‍යාඛ්‍යානයක් කළ මැනැවැයි මෙසේ කරුණාපුරස්සර නිශ්ශරණාධ්‍යාශයෙන් යෙදී පරවැඩෙහි තත්පර ව ප්‍රිය සබ්‍රහ්මචාරී වූ ප්‍රියදර්ශී නම් බුද්ධපුත්‍රයාණන් විසින් කරන ලද ආරාධනාව හා තව ද බුදුන් විසින් ම වදාරන ලද,'*

**භාසයෙ ජොතයෙ ධම්මං - පග්ගණ්හෙ ඉසිනං ධජං**
**සුභාසිත ධජා ඉසයො - ධම්මො හි ඉසිනං ධජො**

**යන මේ බුද්ධානුශාසනාව පිළිගෙන සාධුජනයන්ගේ සිත් පහදවා ශ්‍රද්ධා බුද්ධිවර්ධනය කෙරෙමින් ඔවුන්ට ත්‍රිවිධ සම්පත් සාදාදෙන පිණිස'**

කතුවරයා කෘතියට මුල පුරනුයේ දයාර්ද්‍ර වූත් නිර්මල වූත් චේතනාවක ප්‍රතිඵලයක් අපේක්ෂා කරමිනි. ඒ මාගධික භාෂාවෙහි අබමල් රේණුවක තරම් වත් දැනුමක් නො වූ සිංහලයාට, හෙළ සාධු ජනී ජනයාට හෙළු බසින් ධර්ම ව්‍යාඛ්‍යානයක් කරවීමේ අවිහිංසක පැතුම සිත් දරා ගනිමිනි. ඒ සඳහා ඇරයුම් ලැබෙනුයේ ප්‍රියදර්ශී නම් තවත් භික්ෂූන් වහන්සේ නමකගෙනි. උන්වහන්සේ පිළිබඳ ව කෘතියේ අනෙක් කිසිදු තැනක සඳහනක් දක්නට ලැබෙන්නේ නැත.

කෞශල්‍යාභිවර්ධනයෙහි නො මසුරු, පිනෙහි ඇලුණු, ගැලුණු ගැමියාට අමුතුවෙන් එක් කළ යුතු, ඇබ්බැහි කරවිය යුතු ශ්‍රද්ධාවක් හෝ භක්තියක් නො මැත්තේ ය. ඔවුන් කරගනු ලබන්නා වූ අප්‍රමාණ වූ පුණ්‍ය ධර්මයන්ට තවත් අනුබල දෙමින් සුචරිතයෙහි යොදවමින් දුසිරිතෙන් මුදවමින් තව තවත් ශ්‍රද්ධාව සහ බුද්ධිය වර්ධනය කරවාලීමටත් ත්‍රිවිධ සම්පත්තීන්

සාදා දීමත් පරමාර්ථ කරගනිමින් ජයබාහු ධර්මකීර්ති හිමියෝ සද්ධර්මාලංකාරය රචනා කළ බව ඒ අනුව පැහැදිලි වෙයි.

සද්ධර්මාලංකාරය පුරා ම පැනෙනුයේ එකී සාධු සිතිවිල්ලේ මානුෂීය ගුණ සුවඳ ම ය. බණට දහමට ගැමි සිත ඇඳා ගැනීමටත් ඉන් අයත් වන කුශල සම්පත්තියෙන් නිර්වාණ මාර්ගය සාක්ෂාත් කරගැනීමටත් අනේකවිධ වූ දිව්‍ය මනුෂ්‍ය සංඛ්‍යාත සැප උරුම කර ගැනීමටත් මඟ පෙන්වන ධර්මෝපදේශී කෘතියක් ලෙස ද සද්ධර්මාලංකාරය හැඳින්වීම වටනේ ය.

ඒ සඳහා කතු හිමියන් යොදා ගනුයේ ගැමි විඥානයට සුදුසු භාෂාවකි. ඊට අනුගත වූ රටාවකි. අභිමතයට ම අවැසි ශෛලියකි.

ගැමි දිවියෙන් උකහාගත් උපමා, රූපක ආදි යෙදුම් ද අනුප්‍රාස රසයෙන් බහුල වදන් ද සරල සිංහලය ද ජයබාහු ධර්මකීර්ති හිමියෝ ළඟින් ම ඇසුරු කළ සෙයකි.

ඊටත් වඩා සද්ධර්මාලංකාරය තුළ ලාංකේය සමාජයේ පැනුණු කථා ප්‍රවෘත්තීන් බහුල ව දක්නට ලැබීම තුළින් ජනගත සාහිත්‍යය කෘතියක් බිහි කිරීමේ උත්සාහයක කතු හිමියන් යෙදුණු බවට නිගමනය කළ හැකි ය.

බැලූ බැල්මට ම සද්ධර්මාලංකාරය පොදු ශ්‍රාවකයා අරමුණු කරගත්තක් බවට පෙනුණ ද ඒ තුළ ජයබාහු ධර්මකීර්ති යන යතිවර චින්තනය ද අවිඥානික ව හෝ සවිඥානික ව එළි බසිනු දැකිය හැකි ය.

**'බුද්ධානුශාසනාව පිළිගෙන සාධුජනයන්ගේ සිත් පහදවා ශ්‍රද්ධා බුද්ධි වර්ධනය කෙරෙමින් ඔවුන්ට ත්‍රිවිධ සම්පත් සාධාදෙන පිණිස හා මතු බුදුවන බුදුන් දැක අෂ්ටධර්ම සමෝධානයෙන් යෙදී විවරණ ශ්‍රී ලදින් බුද්ධකාරක ධර්මයන් මුහුකුරුවා ලොවුතුරා බුදු ව මුළු ලොවට අභිවෘද්ධිදායක වෙම්ව' යි යන මාගේ අභිමත ප්‍රාර්ථනාව සාධාගන්නා පිණිස'**

බුදුදහමේ සඳහන් වන අන්දමට ධර්මය දේශනා කිරීම සහ ධර්මය ශ්‍රවණය කිරීම මහත්ඵල මහානිශංස ළඟා කර දෙන්නා වූ පුණ්‍ය ධර්මයෝ ය.

සද්ධර්මාලංකාරය කෘතිය හරහා ධර්මෝපදේශ සපයමින් ධර්මදානයෙහි යෙදෙන ධර්මකීර්ති හිමියන් කුසලයක් අත්පත් කර ගනී. එකී කුශලයෙන් උන්වහන්සේ බෞද්ධයෙකු ව ලැබිය හැකි උතුම් ම සැපත ළඟා කර ගන්නට ප්‍රාර්ථනා කරයි. ඒ නිර්වාණ මෝක්ෂ සම්පත්තිය යි. එය හුදෙක් ම ධර්මකීර්ති හිමියන්ගේ ආත්ම අභිමතාර්ථය මස්තක ප්‍රාප්ත කරගන්නට දැරූ උත්සාහයක් නො වන බව තරයේ ම සිහියේ තබා ගත යුතු ය.

*'සද්ධර්මාලංකාරය ලිවීමෙන් සම්මා සම්බුද්ධත්වය පැතූ ජයබාහු ධර්මකීර්ති හිමිපාණන්ගේ පරමාභිලාෂය වූයේ දනන් දන් දීමෙහි හා ධර්මශ්‍රවණයෙහි යොමු කරවමින් ඔවුන් යහපත් මාර්ගයකට යොමු කරවීම යි. දන් දීම, සිල් රැකීම, බණ ඇසීම වැනි සැදැහැවත් බෞද්ධයෙකු පුරුදු පුහුණු කළ යුතු යහගුණ පිළිබඳ මේ කථාවලින් අඩු නැති ව කියවේ. මෙහි සඳහන් කථා කියවීමෙන් ධර්මඥානයක් ද කථා රසයක් ද ව්‍යක්ත භාෂා භාවිතයෙහි පරිචයක් ද ලබා ගත හැකි ය.'*

උන්වහන්සේ යති දිවියෙන් හිස උදුම්මවා ගත් හෝ භික්ෂුත්වය හෝ ,සිය පරම්පරා නාමය නිසා වැජඹෙන්නට හෝ ආයාස නො ගත් සාමාන්‍ය ගැමි භික්ෂුවක් බව උන්වහන්සේගේ ප්‍රාර්ථනා ප්‍රකාශයෙන් ම තහවුරු වේ.

බෞද්ධ ගැමියාගේ ඒකායන අදිටන වනුයේ මතු බුදු බව ලබන බුදුන් දැක සසර ගමන කෙළවර කර ගැනීම යි.

ධර්මාවබෝධය නිසා ලබන්නා වූ චිත්ත, මානසික දියුණුවටත් වඩා ඔවුහු ආත්මීය ව නිර්වාණය යන සංකල්පයත් සමඟ බුදුන් දකින්නට පෙරුම් පුරන්නෝ වෙති. ආසා කරන්නෝ වෙති.

නිවන් නො දක්කේ වුව ද බුදු බව ලැබූ උත්තමයෙකුගේ රූප සම්පත්තිය දැක ගන්නට හෝ නේත්‍රපුණ්‍යවන්තයෝ වන්නට කැමැත්ත ඇත්තෝ වෙති.

එහෙයින් බුදුන් නො දැක නිවන් දකින්නට ඔවුන් තුළ ඇත්තේ යම් හීනමානයකැයි කීම සාවද්‍ය නො වේ.

එකී හීනමානය බෞද්ධයාට ආභරණයකි; සැනසිල්ලකි; පරම ශාන්තියකි. සසර පුරා විඳි දුක් ගැහැට කෙළවර වන තැන, ආධ්‍යාත්මය නිවී සැනැහී පරම සුවයකට ළං වන තැන, සාදු! සාදු! කියා සිය ආගමික ශාස්තෘවරයාට අභිවන්දනය කරන්නට හැකි වන තැන නිර්වාණය ලබනවා හැර ගැමි ජනයාට ඇති සුවය, සැනසීම, ආත්මාභිලාෂය නම් තවත් කවරේ ද?

කිසිවක් නැත. එය හිස් වූ අවකාශයක් පමණි.

එහෙයින් ම භික්ෂුවක වී ධර්මාවබෝධය ලැබීමට තරම් භාග්‍යවන්ත වුව ද බුදුන් නො දැක නිවන් දකින්නට අකැමැති වූ ජයබාහු ධර්මකීර්ති හිමියෝ ද අස්ථානගත ව සිය සන්තානයේ උපන් නිර්මල හැඟීම කෘතිය හරහා නිරුත්සාහී ව මුදා හරිනු දැකිය හැකි ය.

ඒ:

'මතු බුදුවන බුදුන් දැක.......' යන කියමනෙනි.

හද්දා පිටිසර ගැමියාගේත් ශ්‍රද්ධාගෝචර භික්ෂුවගේත් චිත්ත පරමාර්ථය සමරූපී වූ අයුරු ඒ තුළින් මනා ව සාධනීය වනවා සේ ම එකී සිතිවිල්ලේ ඡායාමාත්‍රය බුද්ධාලම්බන ප්‍රීතියේ අතුරු ඵලයක් ම මිස අන් කවරක් ද?

ඒ අනුව නිර්වාණමාර්ගය දක්වාලමින් නිර්වාණයට ප්‍රවිෂ්ට වන්නට පාරමිතා පූරණය කරගැනීමටත් නිර්වාණයට අවැසි කුසල් දහම් වඩවා ගැනීමට වුවමනා කරන යහගුණයන්හි ආම්පන්න සියල්ලක් සම්පාදනය කරදෙනු උදෙසාත් ධර්මරසෝපේත ව සද්ධර්මාලංකාරය නම් මහා බණකථා කෘතිය මානව දයාවෙන් භික්ෂුත්වය අභිබවා ගිය ජයබාහු ධර්මකීර්ති හිමියන් අතින් රචනා වුණු වගයි.